*සැ. යු.*— මෙම ගැසට් පත්‍රයේ දෙමළ අනුවාදය වෙනම මුද්‍රණය කෙරේ.
*සැ. යු.*- 2011.08.19 දින පළ වූ අංක 1,720 දරන ගැසට් පත්‍රයේ I-II (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,721 - 2011 අගෝස්තු මස 26 වැනි සිකුරාදා - 2011.08.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 1082 |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මීත් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මීත් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 සැප්තැම්බර් මස 02 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 අගෝස්තු මස 19 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# පළාත් සභා නිවේදන

## අරණායක ප්‍රාදේශීය සභාව

### අතුරු ව්‍යවස්ථා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (1) උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 69 වගන්තිය 1/126 වැනි වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර අරණායක ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද එල් පී වායු මගින් ක්‍රියාත්මකවන ආදාහනාගාරය විධිමත්ව පවත්වාගෙන යාම හා පාලනය කිරීම පිළිබඳව අතුරු ව්‍යවස්ථාව 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) උපවගන්තිය සමග කියවිය යුතු, ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය, මහීපාල හේරත්, වන මා විසින් අනුමත කරනු ලැබූ බවත් මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන දින සිට එකී අතුරු ව්‍යවස්ථාව අරණායක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත බලාත්මකවන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහීපාල හේරත්,
පළාත් පාලන විෂය භාර අමාත්‍ය,
සබරගමුව පළාත.

2011 ජූලි මස 20 වැනි දින,
සබරගමුව පළාත් සභාවේ දී ය.

### ආදාහනාගාරයේ අතුරු ව්‍යවස්ථාව

*ආදාහනාගාරයක් පවත්වාගෙන යාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව*

01. මෙම අතුරු ව්‍යවස්ථාව අරණායක ප්‍රාදේශීය සභාවට අයත් පොල්අඹේගොඩ සුසාන භූමියේ පිහිටි ආදාහනාගාරයේ මෘත ශරීර ආදාහනය කිරීම, ගාස්තු නියම කිරීම, අය කිරීම සහ ආදාහනාගාරයේ පාලනය විධිමත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. අරණායක ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන නිලධාරියෙකු විසින් නිකුත් කරනු ලබන අවසර පත්‍රයක් නොමැතිව සභාව සතු ආදාහනාගාරයේ කිසිම මෘත ශරීරයක් ආදාහනය නොකළ යුතු ය.

03. මෙහි දෙවන වගන්තියේ සඳහන් අවසර පත්‍රයක් ලබා ගැනීමට අපේක්ෂා කරන මෙහි මින් මතු ඉල්ලුම්කරු යැයි සඳහන් කරනු ලබන තැනැත්තෙකු විසින් මෙහි දෙවන උපලේඛනයට අනුකූලව පිළියෙල කරන ලද ඉල්ලුම් පත්‍රයක් පහත සඳහන් ලියවිලි සමග සභාපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(i) මරණය ලියාපදිංචි කල රෙජිස්ට්‍රාර් විසින් නිකුත් කරන ලද මරණ සහතිකය ;

(ii) මියගිය තැනැත්තා හා ඉල්ලුම්කරු අතර සම්බන්ධතාවය තහවුරු කරන ලියවිල්ලක්, මියගිය තැනැත්තා පදිංචිව සිටි ග්‍රාම සේවා කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරනු ලබන සහතිකය ;

(iii) මියගිය තැනැත්තාගේ මරණය සම්බන්ධයෙන් අපරාධ නඩු විධිවිධාන සංග්‍රහය යටතේ පරීක්ෂණයක් පවත්වන ලද්දේ නම්, පරීක්ෂණය පවත්න ලද මරණ පරීක්ෂකවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් උපත් හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 41.3 වගන්තිය යටතේ මෘත ශරීරය ආදාහනය කිරීම සඳහා අවසර දෙමින් නිකුත් කරනු ලබන සහතිකය ;

(iv) අජීවී උපතකින් බිහි කරන ලද මෘත ශරීරයක් නම්, උපත් හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 43.1 වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ සහතිකය.

04. සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය සභාපතිවරයා වෙත භාරදීමෙන් පසු ලැබෙන අනුපිළිවෙල අනුව ලේඛනගත කළ යුතු ය.

05. මෘත ශරීරය ආදාහනය කිරීම සඳහා භාරදෙනු ලබන්නේ නම් පළමු උපලේඛනයේ සඳහන් කර ඇති නියමිත ගාස්තු හා රුපියල් 1,000 ක තැන්පතු මුදලක් අයකර ගෙන අවසර පත්‍රය ඉල්ලුම්කරු වෙත නිකුත් කරනු ලැබිය යුතු ය. ආදාහනාගාරයේ භාරකරු වෙත මෘත ශරීරය භාරදිය යුතු වේලාව ද අවසර පත්‍රයේ සඳහන් කල යුතු ය.

06. මෘත ශරීරය ආදාහනය සඳහා භාර ගනු නොලබන්නේ නම් ඒ බව, එයට හේතු වූ කරුණු ද සමග ඉල්ලුම්කරුට ලිඛිතව දැන්විය යුතු ය.

07. සෑම දිනකම පෙරවරු 6.00 සිට රාත්‍රී 8.30 දක්වා කාලය ඇතුළත ආදාහනය කිරීම සඳහා මෘත ශරීර භාරගනු ලැබේ.

08. ඉල්ලුම්කරු අවසර පත්‍රයේ සඳහන් කර ඇති වේලාවට හෝ එයට ප්‍රථම මෘත ශරීරය ආදාහනාගාරය වෙත භාර දිය යුතු ය. ප්‍රමාද වී භාර දීම හේතුවෙන් ඇතිවන අපහසුකම් හෝ අලාභ සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව වගකියනු නොලැබේ.

09. සභාවේ සේවය කල හෝ දැනට සේවය කරන හෝ යම්කිසි සභාපතිවරයෙකුගේ හෝ උපසභාපතිවරයෙකුගේ හෝ මන්ත්‍රීවරයෙකුගේ හෝ සභා සේවකයෙකුගේ හෝ තත්කාලයේ සිටින මන්ත්‍රීතුමන්ලාගේ දෙමව්පියන්ගේ ද (මව, පියා) මෘත ශරීර ආදාහනය කිරීම සඳහා ගාස්තු අය කිරීම සිදු කරනු නොලැබේ.

10. ආදාහනාගාරයේ ආදාහනය කරනු ලබන එක් එක් මෘත ශරීර සම්බන්ධයෙන් ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය මියගිය අයගේ නම හා ඔහු මිය යාමට ප්‍රථම පදිංචි වී සිටි ස්ථානයේ ලිපිනය හා ඉල්ලුම්කරු මියගිය තැනැත්තා හා සමග තිබූ සම්බන්ධතාවය ආදාහනය සිදුකරන ලද දිනය හා වේලාව ආදී විස්තර ආදාහනාගාරයේ භාරකරු විසින් ලේඛණ ගත කල යුතු ය.

11. මෘත ශරීරය ආදාහනය කර දින 07ක් ගත වීමට ප්‍රථම ඉල්ලුම්කරුගේ හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා භෂ්මාවශේෂ භාර ගත යුතු ය. නියමිත කාලය ඇතුළත භාරගනු නොලබනු භෂ්මාවශේෂ කවර ආකාරයකට හෝ බැහැර කිරීමට සභාපතිවරයාට බලය ඇත.

12. ආදාහනාගාර භාරකරුගේ හෝ සභාපතිවරයාගේ අවසරය නොමැතිව ආදාහනාගාර පරිශ්‍රයට ඇතුල්වීම නොකල යුතු ය. එසේ වුව ද මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා අවසර පත්‍රලාභියෙකු සමග පැමිණෙන තැනැත්තෙකුට හෝ තැනැත්තන්ට ඒ සඳහා අවසර දී ඇති ලෙස සලකනු ලැබේ.

13. මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා ආදාහනාගාරයට භාර දීමෙන් පසුව ආදාහනය කිරීම අතරමග හෝ ආදාහනය කිරීමට පෙරාතුව ආදාහනාගාරයේ යන්ත්‍රවල කාර්මික දෝෂයන් මත හෝ විදුලිය

ඇත හිටීමක් මත ආදාහනය කිරීමට නොහැකි වුවහොත්, එම මෘත ශරීරය භූමදානය කිරීමට හෝ ඉල්ලුම්කරුගේ කැමැත්ත පරිදි භූමදානය හෝ වෙනත් සුදුස්සක් කිරීමට ඉඩදීම. සභාපතිවරයාගේ අභිමතයට යටත් වන්නේය.

14. ආදාහනාගාර පරිශ්‍ර තුළ සාමය හා විනය කඩවන ආකාරයට හැසිරීම හෝ ආදාහනාගාර පරිශ්‍රයේ පිහිටි සභාව සතු දේපළ වලට අලාභ හානි සිදු කිරීම හෝ ආදාහනාගාර භාරකරුගේ හෝ ඔහුගේ සහායකයින්ගේ රාජකාරිවලට බාධා කිරීම හෝ ආදාහනාගාර පරිශ්‍රය තුළ සැරසිලි කිරීමක් නොකළ යුතු වන්නේය.

15. මෘත ශරීර ආදාහනය කිරීමට සුදුසු තත්වයකින් ආදාහනාගාරය නඩත්තු කර පවත්වාගෙන යාම සභාවේ කර්තව්‍යයක්වන අතර ආදාහනාගාරය නඩත්තු කිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා කිසියම් කාලයක් තුළ වසා තබනු ලබන්නේ නම් ඒ පිළිබඳ නිවේදනය ආදාහනාගාරයේ ප්‍රකටව පෙනෙන ස්ථානයක හා සභා කාර්යාල දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කිරීම සභාපතිවරයාගේ කර්තව්‍යක් වන්නේය.

16. මෘත ශරීර ආදාහනය කිරීම සඳහා අයකර ගත යුතු ගාස්තු ප්‍රාදේශීය සභාවේ යෝජනා සම්මතයක් මගින් වාර්ෂිකව පනවනු ලැබිය හැකිය. එසේ පනවනු ලබන ගාස්තු ප්‍රාදේශීය සභාව අවශ්‍යයැයි සලකනු ලබන අවස්ථාවල දී සංශෝධනය කල හැක.

17. ආදාහනාගාර භූමිය තුළ භස්මාවශේෂ භූමදානය කිරීමට කටයුතු නොකල යුතු වන්නේය.

18. දෙන සහිත වාහනය හා අවසර ලත් වාහන හැර අනෙකුත් වාහන ඇතුල් කිරීමට තහනම් වන්නේය.

19. ඉල්ලුම්කරු විසින් හෝ ඔහු සමග පැමිණි තැනැත්තෙකු හෝ තැනැත්තන් විසින් ආදාහනාගාර පරිශ්‍රයේ දේපලවලට හානියක් සිදු කරන ලද්දේ නම් ගණනය කරන ලද අලාභය තැන්පත් කරන ලද මුදලින් අඩු කරගෙන ඉතිරි මුදල හෝ කිසිදු අලාභයක් සිදු වී නොමැති විට සම්පූර්ණ තැන්පත් මුදල ඉල්ලුම්කරු විසින් මාස 3ක් ඉක්මව යාමට ප්‍රථම කරනු ලබන ඉල්ලීමකට අනුව පමණක් ගෙවිය යුතු ය. සිදුවී ඇති අලාභය තැන්පත් මුදල ඉක්මයන අවස්ථාවක එකී මුදල සම්පූර්ණයෙන් ගෙවීමට ද, ඉල්ලුම්කරු යටත් වන්නේය.

20. මෙම අතුරු ව්‍යවස්ථාවේ 12 වනි වගන්තියට හා 14 වැනි වගන්තිවල සඳහන් වරදක් කිරීම සම්බන්ධයෙන් කිසියම් තැනැත්තෙකු නිසි අධිකරණ බලැති අධිකරණයක් මගින් වරදකට වරදකරු කරනු ලැබූ අවස්ථාවක අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (2) උප වගන්තියෙන් නියම කර ඇති දඬයන්ට යටත් වන්නේය.

21. පද සම්බන්ධයෙන් අන්‍ය අර්ථයක් අවශ්‍ය වුවහොත් මිස "සභාව" යන්නෙන් අරණායක ප්‍රාදේශීය සභාව අදහස් වේ."සභාපති" යන්නෙන් අරණායක ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ සභාපතිවරයාගේ බලතල කාර්යයන් හා කර්තව්‍යන් ඉටුකිරීම සඳහා යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ බලය පවරනු ලැබ ඇති තැනැත්තෙකු ද අතුළත් වේ."ආදාහනාගාර භාරකරු" යන්නෙන් අරණායක ප්‍රාදේශීය සභාව සතු ආදාහනාගාර භාරකරු ලෙස කටයුතු කිරීම සඳහා පත් කරනු ලැබ ඇති තැනැත්තෙකු ද "මෘත ශරීර" යන්නෙන් මනුෂ්‍යයෙකුගේ මෘත ශරීරය හෝ මෘත ශරීරයෙන් කොටසක් හෝ අජීවී උපතකින් බිහි කරනු ලැබූ සිරුරක් ද, "සේවකයා" යන්නට සභාවේ දැනට සේවය කරනු ලබන ස්ථිර අනියම් සේවා ගිවිසුම් යටතේ සේවය කරනු ලබන සේවකයන් ද, විශ්‍රාමික සේවකයන් ද, ඇතුළත් වේ.

*උපලේඛන අංක 01*

*ආදාහනාගාර ගාස්තු :*

| | | |
|---|---|---|
| 01. | අරණායක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත එක් මෘත දේහයක් ආදාහනය සඳහා | රු. 5,000 0 |
| | කම්කරු කුලිය | රු. 200 0 |
| 02. | අරණායක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිටත එක් මෘත දේහයක් ආදාහනය සඳහා | රු. 6,000 0 |
| | කම්කරු කුලිය | රු. 200 0 |

*උපලේඛන අංක 02*

අරණායක ප්‍රාදේශීය සභා ආදාහනාගාරයේ මෘත ශරීර ආදාහනය කිරීම සඳහා ඉල්ලුම් පත්‍රය

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
ලිපිනය :————.
ජාතික හැඳුනුම්පත් අංකය :————.
ග්‍රාම සේවා කොට්ඨාසය :————.

02. මියගිය තැනැත්තාගේ නම :————.
පදිංචිව සිටි ලිපිනය :————.
ග්‍රාම සේවා කොට්ඨාසය :————.
ජාතික හැඳුනුම්පත් අංකය :————.

03. මියගිය තැනැත්තාට ඉල්ලුම්කරුගේ ඇති සම්බන්ධතාවය :————.

04. මරණ සහතිකයේ අංකය හා දිනය :————.
(මරණ සහතිකයේ පිටපතක් ඇමිණිය යුතු ය.)

05. මරණය ලියාපදිංචි කරන ලේකම්ගේ නම හා ලිපිනය :————.

06. මරණය සිදු වූ ආකාරය :————.

07. මරණ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වන ලද්දේ නම් දිනය හා වේලාව :————.

08. පරීක්ෂණ නිලධාරියාගේ නම හා තරාතිරම :————.

09. පරීක්ෂණ නිලධාරියාගේ නිගමනය :————.

10. මෘත ශරීර ආදාහනය කිරීමට අවසර ලබා දෙන්නේ ද යන වග :————.

11. ආදාහනය කිරීමට අවශ්‍ය දිනය හා වේලාව :————.

12. ආදාහනයෙන් පසුව භස්මාවශේෂ තැන්පත් කිරීම සඳහා නම හා ලිපිනය ලියූ භාජනයක් සපයා දී ඇත/නැත.

ඉහත සඳහන් තොරතුරු සියල්ල නිවැරදි හා සත්‍ය බව සහතික කරමි. අදාළ සහතික අමුණා ඇත.

―――――,
අයදුම්කරුගේ අත්සන.

දිනය :―――――.

**කාර්යාල ප්‍රයෝජනය සඳහා**

01. අවසර බලපත්‍රය නිකුත් කිරීම අනුමත කරමි/නොකරමි පහත සඳහන් හේතු මත අවසර පත්‍රය නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරමි.

i. :―――――.
ii. :―――――.
iii. :―――――.

දිනය :―――――.

**සභාපති/බලයලත් නිලධාරී :**

1. ලේඛනයේ සටහන් කරන ලද .......................................................................දින අංක .......................................දරන ලදුපතින් රුපියල් .......................................හා තැන්පත් රු. .............................................. ක් වශයෙන් රු. ........................... අය කරන ලදී.
2. අවසර පත්‍රය සඳහා ඉදිරිපත් කරමි.
3. ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට හේතු වූ කරුණු ඇතුළත් ලිපි අත්සන් සඳහා ඉදිරිපත් කරමි.

―――――,
අත්සන.

දිනය :―――――.

08-617

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.